විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි

මගේ අංකය / எனது இல. / My No. } අංක - 10/2019

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2019.11.13

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**උපතේ දී ආබාධිත නොවන විට ආබාධිත විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම සඳහා වසර 5 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමුකල යුතුවීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2011.08.15 දිනැති අංක 1719/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 9 වගන්තිය හා බැඳේ. (ඇමුණුම 01)

02. විධිමත් පරිදි අදාළ රෙගුලාසි පනවා ඇති නමුත් වරින් වර මා වෙතින් කරුණු පැහැදිලි කරගැනීම් ඉල්ලුම් කරනු ලබන අවස්ථා දැකගත හැක. තවද ගතයුතු ක්‍රියාමාර්ග නිසි පරිදි නියමිත වෙලාවට සිදුනොවීම හේතුවෙන් විශ්‍රාමිකයන්/ ප්‍රතිලාභීන් අපහසුතාවයට පත්වීම මෙන්ම අනවශ්‍ය ප්‍රමාදයන් හේතුවෙන් විශාල වශයෙන් හිඟ මුදල් ගෙවීමට සිදුවී තිබේ. එබැවින් විශ්‍රාමිකයන්/ ප්‍රතිලාභීන් අපහසුතාවයට පත්වීම වැලැක්වීම සඳහා එම ගැසට් පත්‍රයේ සඳහන් විධි විධාන කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමුකර කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. තවද මෙලෙස හිඟ මුදල් ගෙවීමට සිදුවීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව වෙන්වන මූල්‍ය ප්‍රතිපාදන කළමනාකරණය කරගැනීමේ ගැටළු සහගත තත්ත්වයක් මතුවන අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට මුදල් නිදහස් කිරීමේ ගැටළු පැනනගින බව ද වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

04. එබැවින් ඔබගේ කාර්යාලයෙන් ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන ආබාධිතයින් පිළිබඳ විශේෂ අවධානය යොමුකර අදාළ විශ්‍රාමිකයින් නියමිත කාල සීමාවේ දී අවශ්‍ය පරීක්ෂණයන් සඳහා යොමුකිරීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**ඒ.ජගත් ඩී.ඩයස්**
**විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් : -

1. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
3. ලේකම්, රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
4. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

ඇමුණුම 7

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1719/3 - 2011 අගෝස්තු 15 වැනි සඳුදා - 2011.08.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 44 දරන පනතින් හා 1998 අංක 57 දරන පනතින් හා 1998 අංක 64 දරන පනතින් හා 2010 අංක 8 දරන පනතින් සංශෝධිත 1898 අංක 01 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් අඥාපනත හා අංක 1998 අංක65, 2001 අංක 2, 2010 අංක 9 සංශෝධිත පනත්වලින් සංශෝධනය වූ 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත**

රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා විසින් සම්පාදිත රෙගුලාසි

මෙම රෙගුලාසි ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ රෙගුලාසි වශයෙන් හැඳින්වේ. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනතෙහි 29 වැනි වගන්තිය හා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතෙහි 7 වැනි වගන්තිවලට අනුව මෙම රෙගුලාසි පනවනු ලැබේ.

1. ශාරීරික හෝ මානසික අශක්නුතාවය උපතේ දී හෝ අනත්දරු වයස ඉක්මවීමට පෙර ඇතිවී තිබිය යුතුය.

2. උපතින් ආබාධිත නොවන විට වෛද්‍ය මණ්ඩලයෙන් අනුමත වූ දින සිට විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම ලැබේ.

3. ආබාධිත අනත්දරුවෙකු බවට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත් වන විට වෛද්‍ය මණ්ඩලයකට යොමු කළ යුතුය.

4. දේපළ හිමිකම, පවුලේ ආදායම, වෙනත් ආදායම් මාර්ග තිබීම, විවාහ ජීවිතයට ඇතුළත්ව තිබීම වැනි හේතු මත හා ආබාධිත තැනැත්තාට තම ජීවනෝපාය සලසා ගතහැකිවීම මත විශ්‍රාම වැටුප ගෙවීම තීරණය කිරීමේ බලය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සතුය.

5. මෙම විශ්‍රාම වැටුප් ලාභියා සිරගතවීම, සමාජ විරෝධියකු හෝ අපචාර ක්‍රියාවන්හි නිරත වීම හෝ විදේශගතව වාසය කිරීම මත විශ්‍රාම වැටුප නැවැත්විය හැකිය.

6. මුදල් පරිහරණය කිරීමේ හැකියාව නොමැති තැනැත්තන්ට සුදුසු භාරකරුවෙකු පත්කළ යුතුය. ඔහු ආබාධිත අනත්දරුවාගේ ජීවනෝපාය සඳහා පමණක්ම මෙම විශ්‍රාම වැටුප යෙදවිය යුතුය.

7. විශ්‍රාම වැටුප හෝ ඉන් ප්‍රතිශතයක් ගෙවීමට නියම කිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට හැකිය.

8. මෙම විශ්‍රාම වැටුප සම්බන්ධව උරුමකරුවන්, යැපෙන්නන් සහ ඇටර්නි බලකරුවන් නොසිටිය යුතුය.

1A - G 14927—1590 (2011/08)

9. උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 5ට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමුකළ යුතුය.

10. මෙම රෙගුලාසි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු අතර ඔහු විසින් දෙනු ලබන තීරණයකට එරෙහිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනය කළ හැකිය. එම ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වේ.

මෙම රෙගුලාසි සන්නද්ධ හමුදා වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත් සම්බන්ධයෙන් ද අදාළ වේ.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2011 ජූලි මස 09 වැනි දින,<br>
කොළඹ 07,<br>
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදී ය.

09-09

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.